THE SINHALA

ත්‍රෛමාසිකය 2011 නොවැම්බර්

November 2011

# සිංහල



## පිට රටකට ගිය පුතුට.....

ගම හැර ද රට හැර ද එතෙරට ගිය පුතේ
හොඳින් ඉගෙන රට හදන්න නැවත එන්න පුතේ
රට පාළුයි. ගම පාළුයි නුඹ නොමැතිව පුතේ
පියඹුව දූ දරු සමඟින් හනික එන්න පුතේ

නමේ අගට ඔබ ලැබූ ඒ අකුරු වැලට පුතේ
රන් අමුනා අගය ගන්න එන්නකො මගෙ පුතේ
ඉගෙනුම ගුණ දම් අගයන මේ සිරිලක පුතේ
වෙසෙනා දෙවි-මිනිසුන් හට සෙත සදන්න පුතේ

මව් බිම ඔබ රැකිය යුතුයි මා කීවේ පුතේ
බහ තෝරන වයසෙදිමයි මතක ද එය පුතේ
ඔබ වැනි දිරි දරුවන් සැදූ ලක්මැණිට පුතේ
සැනසුම දී ජය පැන් බොමු අපි එක් වී පුතේ

සාධාරණ නිසි යුතුකම් නිති අගයන පුතේ
ලක්මව සැනසුව මැන අද එදා මෙන්ම පුතේ
නිල තල රජකම් රට තුළ නොලැබ ගියත් පුතේ
දෙස බස රැකි නුඹ මතු බුදු වෙනවාමයි පුතේ

පන්සිල් පද කියනා අය මෙහි එමටයි පුතේ
රකිනා අය අති විරලයි අරුමෙකි එය පුතේ
බුදු වැඩි මග නොව විරිදුව යන මග උන් පුතේ
සතර අපා දොර ඇරුනත් වෙනස් නොවේ පුතේ

මමත් පියත් පින් දම් කොට සැනසෙනවා පුතේ
එපින් බලෙන් තුන් සරණෙත් නිති නුඹටයි පුතේ
සසර වසන තුරු මම නුඹෙ මව් වේවා පුතේ
මෙතේ බුදුන් දැක අපි සැම නිවන් දකිමු පුතේ

*ආචාර්ය ෂෙල්ටන් පීරිස්*

නිව් සවුත් වේල්ස්හි සිංහල සංස්කෘතික හමුවේ ප්‍රකාශනයකි

Published by The Sinhalese Cultural Forum of NSW

ISSN 1834-7061

P.O Box 2379, North Parramatta, NSW 2151, Australia